www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මැතිවරනය අබියස

## On the eve of the US elections

**2008 නොවැම්බර් 3**

මත විමසුම් මගින් ඩිමොක්‍රැටික් පක්ෂයේ අසමමිතික ජයග්‍රහනයක් පෙන්නුම් කෙරෙන තතු යටතේ, මැතිවරන දිනයට ආසන්න වෙද්දී, බැරක් ඔබාමා සහ කොංග්‍රසයේ ඩිමොක්‍රැටික් නායකයන් කල් තියාම පැහැදිලි කරමින් සිටින්නේ, බුෂ් පාලනාධිකාරය මහජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමක්, ඔබාමාගේ ධවල මන්දිරයක හෝ ඩිමොක්‍රැටික් කොංග්‍රසයේ පිලිවෙත් තීන්දු නොකරනු ඇති බවයි.

ජනාධිපති ජෝර්ජ් බුෂ්ට එරෙහි මහජන වෛරය ගසාකෑමෙන් ද "වෙනසක්" හා "නව දේශපාලනයක්" සඳහා කරන කැඳවුම්වල සහ "දැන් පවත්නා බරපතල හදිසිභාවයේ" පිලිබඳ මැතිරීම්වල පදනම මත වැඩ කරන ජනතාව සහ තරුනයන් බලමුලු ගැන්වීමෙන් ද පසුව, ඔබාමා සහ ඩිමොක්‍රැටික් නායකත්වය මහත් ආයාසයකින් පාලක ප්‍රභුවට යලිත් සහතික වන්නේ, තමන් මැතිවරනයෙන් ජයගත හොත්, මූල්‍ය කතිපයාධිකත්වයේ අවශ්‍යතා ආරක්ෂා කරන අතිශයින් ම සම්ප්‍රදායික හා තත්වාරක්ෂක න්‍යාය පත්‍රයක් ක්‍රියාවට දමන බවයි.

එක් ප්‍රකාශකයකුට පසුව තවත් ප්‍රකාශකයකු මතුරන එක ම මන්තරය වී ඇත්තේ, ඩිමොක්‍රැටිකයන් "පමන ඉක්මවා" නොයා යුතු බවයි, ඔවුන් "තනි-පක්ෂ පාලනයක්" ප්‍රතික්ෂේප කල යුතු බවයි, ද්වි-පාක්ෂික ඒකමතිකත්වය නව පාලනාධිකාරයේ එල්ලය විය යුතු බවයි. වෙනත් වචනවලින් කියතොත්, ඔවුහු ප්‍රජාතන්ත්‍රවාදයේ අති මූලික ම ප්‍රඥාප්තිය -- එනම්, මැතිවරන දිනයේ දී ඡන්දදායකයන් ගන්නා තීන්දුව පොදු පිලිවෙත නිර්නය කල යුතු ය යන්න -- ප්‍රතික්ෂේප කරති.

කෝටි සංඛ්‍යාත ජනයා ඔබාමාට ඡන්දය දෙන්නට යන්නේ, එය ඉරාකයේ යුද්ධය ඉක්මනින් අවසන් කිරීමට ද බුෂ් පාලනාධිකාරය විසින් ප්‍රවර්ධනය කරනු ලැබූ මහ ව්‍යාපාරිකයන්ට හා ධනවතුන්ට නිර්බාධිතව ලාභ ගරාගත හැකි පිලිවෙත්වලට විරුද්ධව රැකියා හා ශිෂ්ඨ සම්පන්න ජීවන තත්වයන් ප්‍රවර්ධනය කරන දේශීය පිලිවෙත්වලට ද තුඩු දෙනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි.

කෙසේ වෙතත්, එලඹෙන පාලානාධිකාරයේ පිලිවෙත් මෙහෙයවෙනු ලබන්නේ මෙම මහජන මිථ්‍යාවන් මගින් නොව, ලෝක පරිමාන මූල්‍ය අර්බුදයක ද එක්සත් ජනපදයේ ගැඹුරුවන ආර්ථික කඩා වැටීමක ද ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ අධිරාජ්‍යවාදී මිලිටරි වාඩිලෑමට එරෙහිව දැන් වැඩෙන ප්‍රතිරෝධයේ ද යථාර්ථය මගිනි.

ඔබාමාගේ හා ඔහුගේ මූලික මූලෝපායඥයන්ගේ ප්‍රධාන උත්සුකයක් නම්, විශාල පරිමාන ඩිමොක්‍රැටික් ජයග්‍රහනයක් මහජන බලාපොරොත්තු අවුලුවනු ඇති බව සහ ඒවා ඉටු කිරීමේ කිසිදු අභිප්‍රායක් තමන්ට නැති බව යි.

අගහරුවාදා ඡන්ද විමසීමෙන් කිසිදු දේශපාලන ජනවරමකට හිමිකම් නොකීම 2004 ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂක සෙනෙට් සභික ජෝන් කෙරී විසින්, එන්බීසී සේවයේ ඉරිදා විකාශනය වූ "මාධ්‍ය හමුව" නමැති සම්මුඛ සාකච්ඡා වැඩසටහනට ඔබාමාගේ නියෝජිතයකු ලෙස පෙනී සිටිමින්, ප්‍රකාශයට පත් කරන ලදි. මධ්‍යම-ආදායම් හා අඩු-ආදායම් ලබන පවුල්වලට බඳු සහන ලබා දීම, සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරන සහ විකල්ප බල ශක්ති ප්‍රභේදයක් වර්ධනය කිරීමේ සැලකිය යුතු වැඩපිලිවෙලක් සම්බන්ධයෙන් ඔබාමා ඉක්මනින් ම ක්‍රියා කල යුතු බවට නිව් යෝර්ක් ඩිමොක්‍රැටිකයකු වන නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ ක්‍රම සහ විධි කමිටුවේ සභාපති චාල්ස් රැන්ගල් කල ප්‍රකාශයක් පිලිබඳව වැඩසටහනේ සත්කාරක ටොම් බ්‍රොකෝ කෙරීගෙන් විමසී ය.

එවන් පිලිවෙත් සඳහා මුදල් සොයා ගන්නේ කෙසේ ද යන්න විමසූ කල රැන්ගල් මෙසේ පිලිතුරු දී තිබුනි: "මුදල් කොහෙන් එනවද කියල මගෙන් අහන්න එපා. පෝල්සන් ගිය තැනට ම තමයි මාත් යන්න යන්නෙ." මෙය වනාහි භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් විසින් මූලිකත්වය දෙන ලද ඩොලර් බිලියන 700ක වොල් වීදියට ඇප දීමේ වැඩපිලිවෙලට කල සැඳහුමකි.

"එය වගකිව යුතු මූල්‍ය පිලිවෙතක් ද?" යනුවෙන් බ්‍රොකෝ කෙරීගෙන් විමසී ය. සෙනෙට් සභිකයා එයට ප්‍රතිචාර දැක්වූයේ මෙසේ යː "මම ඒ ඔක්කොට ම එකඟ වෙන්නේ නැහැ. බැරක් ඔබාමාත් එහෙමයි. බැරැක් ඔබාමා තමයි ජනාධිපති තනතුරට තරග

කරන්නෙ. ඔහු ඉතා පැහැදිලිව කියලා තියෙනවා, වොෂිංටනය වෙත මූල්‍යමය වගකීම පුනස්ථාපනය කිරීමට අප කටයුතු කරන බව."

සිය පාලනාධිකාරයට සැලකිය යුතු ආකාරයකින් රිපබ්ලිකන්වරු සම්බන්ධ කර ගැනීමකට ඔබාමා උත්සාහ කරනු ඇතැයි ද කෙරී තව දුරටත් පැවසී ය. "ඔහු ආන්ඩු කරන්න යන්නෙ රට එකමුතුකමකට ගෙන එන ආකාරයකටයි. අපගේ බහුතරය කුමක් වුවත්, ඔහු වඩා පුලුල් ඒකමතිකත්වයක් කරා ලගා වෙන්න උත්සාහ කරාවි. ඒ මක් නිසා ද කිය තොත්, මේ අවස්ථාවේ අපට ඇමරිකාවේ ආන්ඩු කරන්න පුලුවන් එකම විධිය ඒක නිසා." රිපබ්ලිකන්වරු විරුද්ධ වන පිලිවෙත් සම්මත කර ගනු පිනිස ඩිමොක්‍රැටිකයන් සිය බහුතරය යොදා ගැනීමට උත්සාහ නොකරනු ඇතැයි ද සෙනෙට් සභිකයා යෝජනා කලේ ය. "ඡන්ද 51කින් හෝ ඡන්ද 60කින් දේවල් සම්මත කිරීමට අපට අවශ්‍ය නැහැ" යයි සෙනෙට් සභාවට සැඳහුම් කරමින් ඔහු පැවසී ය." අපට අවශ්‍ය ඡන්ද 85 බහුතරයන් ගොඩනැගීමටයි."

මෙම ප්‍රකාශය බැරෑරුම් සැලකිල්ලට යොමු කිරීම වටනේ ය. සෙනෙට් සභාව තුල "ඡන්ද 85 බහුතරයන්" අවධාරනය කිරීම මගින් අදහස් කෙරෙන්නේ, ආන්ඩුවේ පිලිවෙත් පිලිබඳ නිෂේධ බලයක් රිපබ්ලිකන් සුලුතරයට පැවරීම යි. එය ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ මොන යම් හෝ සංකල්පයක් ප්‍රතික්ෂේප කිරීමට සම වේ.

අගහරුවාදා ඩිමොක්‍රැටිකයන් ජය ගත හොත්, ඒ බුෂ් විසින් පසුගිය අට වසරක කාලය තිස්සේ ගෙන යන ලද යුද්ධයේ හා සමාජ ප්‍රතිගාමිත්වයේ පිලිවෙත් ආපසු හැරවීමක් සඳහා පවත්නා පුලුල් මහජන මනෝගතිය හේතු කොට ගෙන වනු ඇත. එහෙත් කෙරී අවධාරනය කරන්නේ, ඩිමොක්‍රැටිකයන් තමන්ට ජනවරමක් තිබෙන්නාක් මෙන් ආන්ඩු කිරීම වැරැද්දක් වනු ඇති බවට යි.

මෙම ආස්ථානයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය අවධාරනය කෙරුනේ හිටපු ඩිමොක්‍රැටික් සෙනෙට් සභික බොබ් කෙරේ කල අදහස් දැක්වීම් සමග කෙරී සිය එකගතාව ප්‍රකාශ කිරීමත් සමග ය. බොබ් කෙරේ මෑතක දී මෙසේ ප්‍රකාශ කලේ යඃ "මගේ මතයට අනුව, ජනාධිපති ඔබාමා කෙනෙකුගේ සාර්ථකත්වයට මූලික තර්ජනය එල්ල වනු ඇත්තේ . . . සිය කොංග්‍රස් බහුතරයේ ප්‍රමානය මගින් නිර්භීත වූ . . . සමහර ඩිමොක්‍රැටිකයන් වෙතිනි. . . . කිසිදු අවිනිශ්චිත භාවයට ඉඩ නොතබා පහත කාරනාව කොංග්‍රසය වෙත දැනුම් දීමට ඔබාමාට අවශ්‍ය වනු ඇතඃ ඩිමොක්‍රැටිකයන් තමන්ගේ පිලිවෙත් සියල්ල වෙනුවෙන් ජනවරමක් දිනා ගෙන නැත. ඒ වෙනුවට, ඇමරිකානු ජනතාව අසාර්ථක වූ පවත්නා තත්වයක් පිලිබඳ සිය අසන්තෘප්තිය ගැඹුරින් ම තහවුරු කර ඇත. ඊලග ජනාධිපති නව, පාර්ශ්වීය භාවයෙන් වඩා අඩු, මාවතක් සැලසුම් කර ගත යුතු ය."

එවන් ආස්ථානයක්, ශ්‍රේෂ්ඨාධිකරනය විසින් 2000 දී බුෂ් ධවල මන්දිරයේ ස්ථාපනය කරනු ලැබීමෙන් පසුව රිපබ්ලිකන්වරු ආන්ඩු කල ආකාරයට මුලුමනින් ම ප්‍රතිකූල ය. බුෂ් සිය ඩිමොක්‍රැටික් ප්‍රතිවාදියා වන ඇල් ගෝර් හමුවේ මහජන ඡන්දයෙන් පරාජයට පත්ව තිබූ සහ නොවැම්බර් 4 දායින් පසුව ඩිමොක්‍රැටික්වරු භුක්ති විඳිනු ඇති බහුතරයන්ට වඩා බෙහෙවින් අඩු බහුතරයන් නියෝජිත මන්ත්‍රී මන්ඩලය සහ සෙනෙට් සභාව තුල රිපබ්ලිකන්වරුන්ට පැවති නමුදු, එලඹෙන පාලනාධිකාරය පුරසාරම් දෙඩුවේ මැතිවරනය තමන්ට සියයට 100ක බලයක් ලබා දුන් බවටයි.

බුෂ් එයට අනුකූලව සිය පිලිවෙත් සකසනු වස් ඉදිරියට ගියේ, (සැලකිය යුතු ඩිමොක්‍රැටික් සහයෝගයක් ද සහිතව) ධනවතුන් සඳහා දැවැන්ත බදු සහන ප්‍රදානය කිරීමේ පිලිවෙත් ඉදිරියට තල්ලු කරමින් සහ ඉන් පසුව ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ යුද්ධ ද ඇමරිකානු මහජනතාවගේ පුලුල් විරුද්ධත්වයට ලක්වූ තවත් පිලිවෙත් ගනනාවක් ද ක්‍රියාවට දමමිනි.

ඉරාකයේ යුද්ධයට එරෙහි මහජන වෛරය මගින් බොහෝ සෙයින් ඉදිරියට තල්ලු කෙරුනු 2006 කොංග්‍රස් මැතිවරනවලින් ඔවුන් ලබා ගත් පුලුල් පරිමාන ජයග්‍රහනයෙන් පසුව ඩිමොක්‍රැටිකයන් ක්‍රියා කල ආකාරයට ම, එලඹෙන ඩිමොක්‍රැටික් පාලනාධිකාරයක් ද කටයුතු කරනු ඇති බව පෙන්නුම් කරන දර්ශකයකි කෙරීගේ ප්‍රකාශය. එදා නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ හා සෙනෙට් සභාවේ අලුතින් ස්ථාපිත කෙරුනු ඩිමොක්‍රැටික් බහුතරයෝ, ද්වි-පාක්ෂික පදනමක් මත ජනාධිපති බුෂ් සමග වැඩ කිරීමට ප්‍රතිඥා දුන්හ. නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ නව කතානායිකා නැන්සි පෙලොසි, බුෂ් දෝෂාභියෝගයකට ලක් කිරීමේ මොන යම් හෝ ප්‍රයත්නයක් වහාම බැහැර කල අතර, බුෂ්ගේ ජනාධිපති ධුර කාලයේ ඉතිරි කොටස පුරා ම ඉරාක යුද්ධය සඳහා දිගට ම මුදල් වෙන් කිරීමට ද අවසානයේ එකග වූවා ය.

කෙරීගේ සහ සෙසු ඩිමොක්‍රැටික් ප්‍රකාශකයන්ගේ අදහස් දැක්වීම් මගින් අවධාරනය කෙරෙන්නේ, සමස්ත 2008 මැතිවරනයේ ම සාරභූත වංචාකාරී ස්වභාවය යි. ඡන්දය පාවිච්චි කරන සංඛ්‍යාවේ දැවැන්ත ඉහල නැගීම් සහ ජනගහනයේ නව ස්ථරවල, විශේෂයෙන් ම තරුනයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ පුලුල් සහභාගිත්වය තිබිය දී ම, ඇමරිකානු ජනතාව පාලක ප්‍රභූව තුල පවත්නා ගැටුමක අතිරේකයන්ට නොඅඩු දෙයක් ලෙස සේවය කිරීමට පමනක් සීමා වනු ඇත. මැතිවරන දිනය හමාර වීමත් සමග ම, ඔබාමා "බලාපොරොත්තුව" සහ "වෙනස" ආපසු සිය බ්‍රෑන්ඩ්කේසයට දමා ගෙන සිය සැබෑ වැඩකටයුතුවලට බැස ගනු ඇතඃ එනම්, සංගත ඇමරිකාවේ අවශ්‍යතා ආරක්ෂා කිරීම යි.

බැංකු සහ සමපේක්ෂකයන් ඇප දී ගලවා ගනු වස් මහජන මුදල්වලින් ට්‍රිලියන ගනන් ලබා දෙමින්, ඩිමොක්‍රැටිකයෝ, මූල්‍ය වෙළඳ පොලවල් දියවී යාමේ අන්තරායට නොපමාව ප්‍රතිචාර දැක්වූහ. මෙම දේශපාලනඥයෝ ම මැතිවරනයෙන් පසුව වැඩ කරන ජනතාව වෙත හැරී කියනු ඇත්තේ, විශේෂයෙන් ම මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ යුද්ධ වෙනුවෙන් ඊටත් වඩා වියදම් කිරීමේ අවශ්‍යතාව හමුවේ, සෞඛ්‍ය සේවා, රැකියා, අධ්‍යාපනය සහ සෙසු සමාජ ප්‍රතිලාභ සැපයීමට මුදල් නැති බවයි.

**පැට්‍රික් මාටින්**

© www.wsws.org